7 . 250

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## II වන වාර පරීක්ෂණය - 2014

පෙරදිග සංගීතය - I, II

7 ශ්‍රේණිය

කාලය පැය 1, 1/2

## පෙරදිග සංගීතය - I පත්‍රය

නම / අංකය : ..................................................

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**1 - 10 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ස - රි / ග ම - / ස රි ග / ම ප - / ස රි ග / ම ප ධ / නි - - / - - -
යන ස්වර පාදයට අයත් ස්වර ස්ථාපන ගීතය වන්නේ.

i. මුනි සිරිපාදේ සමනල මුදුනේ  ii. ඈත හිමේ ගිරි මුදුනේ
iii. සවන පිනන ගීත මිහිර  iv. කඳුපෙළ අතරේ තුරු වදුලේ

02. එක් විභාගයක තිබිය යුතු අඩුම මාත්‍රා ගණන වන්නේ,

i. 4 කි.  ii. 3 කි.  iii. 2 කි.  iv. 1 කි.

03. හින්දුස්ථානි සංගීතය අයත් වනනේ කවර සම්ප්‍රදායට ද ?

i. පෙරදිග  ii. කර්ණාටක  iii. බටහිර  iv. අපරදිග

04. සංගීතයේ හමුවන විකෘති ස්වර, එක් අවස්ථාවක දී Sharp Notes ලෙසත්, තවත් අවස්ථාවක දී Flat Notes ලෙසත් හැඳින්වෙන්නේ,

i. පෙරදිග සංගීතයේ දී ය.  ii. හින්දුස්ථානි සංගීතයේ දී ය.
iii. කර්ණාටක සංගීතයේ දී ය.  iv. බටහිර සංගීතයේ දී ය.

05. කෝමළ ස්වර සහිත ස්වර ස්ථාපන ගීයකි.

i. කඳු කඳු නැගෙනා  ii. බින්දු බින්දු එක්වෙලා
iii. පොත පත කියවා  iv. බැතිනා සිරිපා කරුණා කරනා

06. චිකාරි තත් සහිත සංගීත භාණ්ඩයකි.

i. එස්රාජය  ii. සිතාරය  iii. දිල්රුබාව  iv. බටනලාව

07. බටනලාව වාදනයේ දී දෑතේ ඇඟිලි 6 ක් උපයෝගී වන අතර, සිදුරු සියල්ල වැසීමෙන් උපදින ස්වරය වන්නේ,

i. " ස " ස්වරය යි.  ii. " ග " ස්වරය යි.  iii. " ම " ස්වරය යි.  iv. " ප " ස්වරය යි.

08. සස, සරිග, රිරි, රිගම, .............. යන රටාවේ ඊළඟ පියවර වන්නේ,

i. සරි, ගමප, ii. ගග, ගමප iii. මම, මපධ iv. පප, පධනි

09. සංගීත භාණ්ඩ වර්ගීකරණය යටතේ බටනලාව අයත් වන්නේ කවර වර්ගයට ද ?

i. තත් ii. සුසිර iii. ඝන iv. අවනද්ධ

10. සංනිවේදන මාධ්‍යයක් ලෙස, භාවිත කරන ආතත ගණයට අයත් අවනද්ධ භාණ්ඩය කි.

i. බංකු රබාන ii. දවුල iii. උඩැක්කිය iv. තම්මැට්ටම

(ලකුණු 1 × 10 = 10)

- **පහත දැක්වෙන ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

**A කොටසට අදාළ නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | | | B |
|---|---|---|---|
| 11. | උඩරට නර්තන සම්ප්‍රදායේ එන ප්‍රධාන අවනද්ධ භාණ්ඩය යි. | i. | වයලිනය |
| 12. | මුරලි, බන්සූරි යනුවෙන් වර්ග දෙකකි. | ii. | පියානෝව |
| 13. | පෙරදිග හා අපරදිග වශයෙන් ප්‍රචලිත තත් භාණ්ඩයකි. | iii. | සිතාරය |
| 14. | "මිස්රාබය" මගින් තත් කම්පනය කරවයි. | iv. | බටනලාව |
| 15. | වැඩිම සප්තක ප්‍රමාණයක් අඩංගු සංගීත භාණ්ඩයකි. | v. | ගැටබෙරය |

(ලකුණු 05)

- **පහත වරහන් තුළ දැක්වෙන වචන අතුරින් වඩාත් නිවැරදි වචනය තෝරා හිස්තැන් පුරවන්න.**

**(ස්වර ස්ථාපන, රබන්, නැළවිලි, උපදේශාත්මක, තුන් සරණේ)**

16. "ආරාරෝ ආරිවරෝ" ගීතය ද්‍රවිඩ .............................................. ගීතයකි.

17. "මව්පියො ආදී සොඳුරු තමාගේ" ගීතය .............................................. ගීතයකි.

18. "උරතල කැල ඔඩිය ලෙන්ද" .............................................. ගීතයකි.

19. "පෙරයම බුද්ධං සරණේ ගඤද්ගදයි" යන ගීතය .............................................. ගීතයකි.

20. "සවන පිනන ගීත මිහිර" නම් ගීතය .............................................. ගීතයකි.

(ලකුණු 05)

- **පළමු වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

**(01.)**

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | රි | රි | ග | ග | ම | ම | ප | ධ | ධ | නි | නි | ස |

**ඉහත දී ඇති සටහන ඇසුරු කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

i. ඔබ ඉගෙන ගත් ප්‍රකෘති විකෘති ස්වර ඇසුරු කර ගනිමින් ඉහත සටහන නිවැරදි ව (ස්වර සංඥා සහිතව) ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න. **(ලකුණු 04)**

ii. ඒ ඇසුරින් අචල ස්වර හඳුනාගෙන ඒවා නම් කරන්න. **(ලකුණු 01)**

iii. විකෘති ස්වර කීයක් තිබේ ද ? ඒවා සංඥා සහිතව ලියා දක්වන්න. **(ලකුණු 03)**

iv. ඔබ දන්නා ස්වර පුවරු සංගීත භාණ්ඩ 2 ක් නම් කරන්න. **(ලකුණු 02)**

**(02.)** • **ලය යනු තාලයේ වේගයයි.**

i. ලයෙහි ප්‍රධාන කොටස් කීය ද ? **(ලකුණු 01)**

ii. ඒවා නම් කරන්න. **(ලකුණු 03)**

iii. දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ ...
සවන පිනන ගීත මිහිර ...
යන ගී පාද දෙක වෙන වෙන ම ගෙන මාත්‍රා බෙදෙන ආකාරය අනුව ප්‍රස්තාර කර පෙන්වන්න. **(ලකුණු 06)**

**(03.)** **(අ)** වයලීනයක රූප සටහනක් ඇඳ පහත සඳහන් කොටස් වලින් 4 ක් නම් කරන්න.

i. Finger Board - (ෆිංගර් බෝඩ්)
ii. String - (ස්ට්‍රිං)
iii. Chin rest - (චින් රෙස්ට්)
iv. Bridge - (බ්‍රිජ්)
v. F. Hole - (එෆ්හෝල්)
vi. Adjesters - (එජස්ටර්ස්)
vii. Scroll - (ස්ක්‍රෝල්) **(ලකුණු 03 + 04 = 07)**

**(ආ)** වයලීනයක තත් සංඛ්‍යාව කීය ද ? එම තත් අපරදිග ක්‍රමයට නම් කරන්න. **(ලකුණු 03)**

**(04.)** දෙමව්පියන්ට වැඩිහිටියන්ට ගරු කරන පුද්ගලයා රටට දැයට වැඩදායී මනා ආදර්ශවත් යහපත් පුරවැසියෙක් වේ.

i. ඔබ උගත් ගීත අතුරින් ඉහත අදහසට ගැළපෙන ගීතයක් ලියා දක්වන්න. **(ලකුණු 04)**

ii. එම ගීයේ අදහසට අනුව පාසලේ උදෑසන රැස්වීමකට සුදුසු කතාවක් කෙටියෙන් ගොඩ නගන්න. (කරුණු 5 ක් පමණ තිබීම සෑහේ.) **(ලකුණු 06)**